# මානව සම්පත් අභිවර්ධන ආයතනය

# විශේෂ නිවේදනය!

## අතිරේක භාෂාවක් ලෙස දමිළ භාෂා ඩිප්ලෝමාව

කොළඹ විශ්වවිද්‍යාලයීය මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් පවත්වනු ලබන උක්ත වැඩසටහන නව විෂය නිර්දේශය යටතේ පැවැත්වීමට කටයුතු ආරම්භ කොට ඇති බව දැනටමත් ඔබ දැනුවත්ව ඇත.

එහි ප්‍රතිඵලයක් ලෙස පැරණි විෂය නිර්දේශයට අදාළව අවසන් උසස් පාඨමාලාව ආරම්භ කිරීම සඳහා ආයතනය මේ වන විටත් කටයුතු කෙරෙමින් පවතී. ඒ අනුව, ඔබ

***<u>මූලික සහ අන්තර්මධ්‍යම පාඨමාලාවන් සමත්ව</u> ඩිප්ලෝමාව සඳහා උසස් පාඨමාලාව සම්පූර්ණ කර නොමැති අයෙක් නම්,***

පැරණි විෂය නිර්දේශ යටතේ පවත්වන අවසන් උසස් පාඨමාලා වැඩසටහන 2026 ජූනි මස පළමු සතියේ ආරම්භ කිරීමට නියමිත බැවින් ඒ සඳහා ලියාපදිංචි වීමට බලාපොරොත්තු වේ නම් 2026.05.29 වන දිනට පෙර ආයතනයේ දමිළ භාෂා අංශය සම්බන්ධ කර ගන්නා ලෙස ඔබට කරුණාවෙන් දැනුම් දෙමි.

**<u>ඒ සඳහා ඔබ දමිළ භාෂා අංශයේ ඔබව අනුයුක්ත කොට ඇති WhatsApp (077 253 3040) සමූහයට පණිවිඩයක් ලෙස හෝ tamilunit@ihra.cmb.ac.lk යන විද්‍යුත් ලිපිනයට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් ආයතනයට දැනුම්දීමක් සිදු කරන ලෙස ඉල්ලා සිටිමු.</u>**

යම් හෙයකින් මෙම අවසන් අවස්ථාව සඳහා ඔබට සම්බන්ධ විය නොහැකි වුවහොත් ඔබගේ ඩිප්ලෝමාවට අදාළ ශිෂ්‍යභාවය අවසන් කිරීමට සිදුවන බව කණගාටුවෙන් දැනුම් දෙමි.

නව විෂය නිර්දේශ යටතේ ක්‍රියාත්මක වන දමිළ භාෂා ඩිප්ලෝමාව එක් අවුරුදු පාඨමාලාවක් ලෙස පැවැත්වෙන බැවින්, ඒ සඳහා පැරණි විෂය නිර්දේශය යටතේ අධ්‍යයනය කරන ලද කාලය කිසිසේත්ම ගැලපීමක් සිදු කිරීමට නොහැකි බව කරුණාවෙන් සලකන්න.

ඔබ සැමට පාඨමාලාවේ අධ්‍යයන කටයුතු සාර්ථකව අවසන් කොට දමිළ භාෂා ඩිප්ලෝමාලාභීන් ලෙස ආයතනයෙන් සුදුසුකම් ලැබීමට හැකි වේවායි අපි සුභපතමු!

එස්.එස්. සමරතුංග
නියෝජ්‍ය ලේඛකාධිකාරි